**4.2** **ණය වාරික මුදල් හා පොලී මුදල් අයකර ගැනීම.**

(අ) හර - මුදල් ගිණුම / ජංගම ගිණුම
බැර - සාමාජික තැන්පත් ගිණුම

(ආ) හර - සාමාජික තැන්පත් ගිණුම
බැර - ලැබිය යුතු දිවිනැගුම සහන අරුණ ණය ගිණුම (වාරික මුදල) (කේත අංක 3115)
බැර - ලද පොලී දුන් ණය ගිණුම (අයකරගත් පොලී මුදල)

නියමිත පරිදි, වාරික මුදල් නොගෙවන අවස්ථාවක අයකරන දඩ ගාස්තුව ලද පොලී දුන් ණය ගිණුමට බැර කිරීමට කටයුතු කළ යුතුය.

**4.3** දිවිනැගුම සහන අරුණ ණය වැඩසටහන යටතේ, පාරිභෝගික, ජීවනෝපාය සංවර්ධන, ණය මුදල් පියවීම, හදිසි අවශ්‍යතා සඳහා ලබාදෙන ණය මුදල්, ජීවනෝපාය සංවර්ධන හා පාරිභෝගික වශයෙන් අංශ දෙකට වෙන් කර, පුද්ගලික ලෙජර් දෙකක් ලෙස නඩත්තු කල යුතුය.

**4.4** මෙම ණය යෝජනා ක්‍රමය සඳහා ද, ණය තොරතුරු රෙජිස්තරය, පාලන ගිණුම, ණය කාඩ් ආදිය අළුතින් ආරම්භ කර පවත්වාගෙන යා යුතුය.

**5.** දිවිනැගුම සහන අරුණ ණය යෝජනා ක්‍රමය යටතේ, ණය මුදාහැරීමේදී භාවිතා කළ යුත්තේ, $S_3$ 11 ඇමුණුම් 07 (ස.බැ.ස. ණය පෝර්ම අංක 03 සංශෝධිත) යටතේ හඳුන්වාදී ඇති **දිවිනැගුම ප්‍රජා මූල බැංකු හා ණයලාභියා අතර ඇති කර ගනු ලබන තනි පුද්ගල ණය ගිවිසුම් පත්‍රයයි.**

**6.** **ප්‍රගති වාර්තා සකස් කිරීම හා එවීම.**

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, ලබාදෙන ණය මුදල් සඳහා ද, මාසික කේවල ශේෂ පිරික්සුම් සකස් කර, පොදු ලෙජරය සමඟ තුලනය කළ යුතුය, මාසික වාර්තා හඳුන්වා දී ඇති ආකෘති පත්‍රවලට අනුකූලව සකස් කර, සෑම මසක් අවසාන වී එළැඹෙන මාසයේ 05 වන දිනට පෙර, දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිතිය මඟින් ඉදිරිපත් කළ යුතුය.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය)- වැ.බ.

කේ.කේ.එල්. චන්ද්‍රතිලක,
නි. අධ්‍යක්ෂ (ක්ෂුද්‍රමූල්‍ය)

පිටපත් :-

1 ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
2 ලේකම්, මුදල් අමාත්‍යාංශය.
3 දිවිනැගුම කලාප අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්.
4 දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්.
5 ප්‍රාදේශීය ලේකම්වරුන්.
6 සහකාර කොමසාරිස්වරුන්.
7 දිස්ත්‍රික් දිවිනැගුම නිලධාරීන්.
8 දිවිනැගුම ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරුවන්.
9 ප්‍රධාන අභ්‍යන්තර විගණක.